රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 03/2010

මගේ අංකය :- සිඑල්එස්/අන්තර් උසස්/V
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
2010.04.21

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරු,

**<u>ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථාව අනුව පුස්තකාලයාධිපති සේවයේ II පන්තියට/ I පන්තියට හා විශේෂ පන්තියට විභාගයක් නොපවත්වා උසස් කිරීම.</u>**

2009 සැප්තැම්බර් 24 දිනැති අංක 1620/22 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 10:2:2 , 10:3:2 සහ 10:4 ඡේද යටතේ අන්තර්කාලීන විධිවිධාන අනුව උසස් කිරීම සඳහා පහත සුදුසුකම් ලබන ශ්‍රී ලංකා පුස්තකාලයාධිපති සේවයේ පුස්තකාලයාධිපතිවරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. **II පන්තියට උසස් කිරීම සඳහා සුදුසුකම්**

(i) ශ්‍රී ලංකා පුස්තකාල සේවා සංගමයේ මධ්‍ය පරීක්ෂණය සමත්ව තිබීම.

හෝ

(ii) ශ්‍රී ලංකාව තුළ පිළිගත් විශ්ව විද්‍යාලයක පුස්තකාල විද්‍යා හා ලේඛනකත්ව වෘත්තීය දෙවන සහතිකය ලබා තිබීම.

හෝ

(iii) විශ්ව විද්‍යාලයකින් ලබාගත් පුස්තකාල විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා සහතිකය තිබීම.

සහ

(iv) ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් පිළිගත් පුස්තකාලයක III ශ්‍රේණියේ පුස්තකාලයාධිපතිවරයෙකු ලෙස වසර 10ක සතුටුදයක සක්‍රීය සේවා කාලයක් සපුරා තිබීම.

සහ

(v) 1997.08.01 දින සිට ක්‍රියාත්මක වන සේවා ව්‍යවස්ථාව අනුව III ශ්‍රේණියට අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත කාල පරිච්ඡේදය තුළ සමත්ව තිබීම.

03. I පන්තියට උසස් කිරීම සඳහා සුදුසුකම්

(i) පිළිගත් රජයේ පුස්තකාලයක II ශ්‍රේණියේ පුස්තකාලයාධිපතිවරයෙකු වශයෙන් වසර 13ක සේවා කාලයක් සපුරා තිබීම.

(ii) ඉහත වසර 13ක සේවා කාලය සම්පූර්ණ කරන දිනට වසර 05ක සතුටුදායක සක්‍රිය සේවා කාලයක් සපුරා තිබීම.

(iii) 1997.08.01 දිනට ක්‍රියාත්මක වූ සේවා ව්‍යවස්ථාව අනුව නියමිත කාල පරිච්ඡේදය තුළ II ශ්‍රේණියට අදල කාර්යක්ෂමතා කඩඉම් පරක්ෂණය සමත්ව තිබීම

හෝ

(iv) ශ්‍රී ලංකාව තුළ පිළිගත් විශ්ව විද්‍යාලයක පුස්තකාල විද්‍යාවේදී උපාධිය සහ උපාධිය ලැබීමෙන් පසු II ශ්‍රේණියේ පුස්තකාලයාධිපතිවරයෙකු වශයෙන් වර්ෂ 08ක සේවා කාලයක්

හෝ

(v) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ අවසාන පරීක්ෂණ සහතිකය සහ පිළිගත් පුස්තකාලයක II ශ්‍රේණියේ පුස්තකාලයාධිපතිවරයෙකු ලෙස වර්ෂ 08ක සේවා කාලයක්

හෝ

(vi) ශ්‍රී ලංකාව තුළ පිළිගත් විශ්ව විද්‍යාලයක පුස්තකාල විද්‍යා සහ ප්‍රලේඛන සේවා වෘත්තීය උසස් සහතික පත්‍රය සහ II ශ්‍රේණියේ පුස්තකාලයාධිපතිවරයකු ලෙස වර්ෂ 08ක සේවා කාලයක්

හෝ

(vii) පිළිගත් විශ්ව විද්‍යාලයක ශාස්ත්‍රවේදී උපාධිය සහ ශ්‍රී ලංකා පුස්තකාල මණ්ඩලයේ මධ්‍ය පරීක්ෂණය සමත්වීම සහ II ශ්‍රේණියේ පුස්තකාලයාධිපතිවරයෙකු වශයෙන් වර්ෂ 08ක සේවා කාලයක් තිබීම.

සහ

(viii) ඉහත වසර 08ක සේවා කාලය සම්පූර්ණ කරන දිනට පූර්වාසන්න වසර 05ක සතුටුදායක සක්‍රිය සේවා කාලයක් සපුරා තිබීම.

(ix) 1997.08.01 දින සිට ක්‍රියාත්මක සේවා ව්‍යවස්ථාවට අනුව නියමිත කාල පරිච්ඡේදය තුළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබීම.

04. විශේෂ පන්තියට උසස් කිරීම

(i) 1997.08.01 දින සිට ක්‍රියාත්මක වූ සේවා ව්‍යවස්ථාවට අනුව දැනට අධි ශ්‍රේණියේ සිටින නිලධාරීන් විශේෂ පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

(ii) 1997.08.01 දින සිට නව සේවා ව්‍යවස්ථාවට අනුව අන්තරකාලය අවසන්වන දින තෙක් (2012.09.01 දක්වා) විශේෂ පන්තියේ නව දුරටත් පවත්නා පුරප්පාඩු සඳහා එම කාලය තුළ සේවයේ යෙදී සිටි සහ පූර්වාසන්න වසර 05ක සතුටුදායක සේවා කාලයක් ඇති I ශ්‍රේණියේ

පුස්තකාලයාධිපතිවරුන්ගේ ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාවය මත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මගින් කරන නිර්දේශ මත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් උසස්වීම් කරනු ලැබේ.

05. අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයට අයත් උසස්වීමට සුදුසුකම් ලබන සියළුම නිලධාරීන් මේ සමග අමුණා ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස්කරගත් අයදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත ඉදිරිපත් කල යුතුය. දෙපාර්තමේන්තු ප්‍රධානීන් අයදුම්පතේ දක්වා ඇති විස්තර නිවැරදි බවට සහතික කර අයදුම්කරුගේ උප්පැන්න සහතිකය, පත්වීම් ලිපිය, ස්ථිර කිරීමේ ලිපිය, උසස්වීම් ලිපිය, අධ්‍යාපන සහතික සහ සුදුසුකම් සනාථ කරන අනෙකුත් සහතිකවල සහතික පිටපත්ද සමග තම අමාත්‍යාංශ ලේකම්ගේද නිර්දේශයන් සහිතව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය.

06. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2010.05.31 වේ.

07. 2009.09.24 දිනැති අංක 1620/22 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නව සේවා ව්‍යවස්ථාවේ 9:2:2:1 විධිවිධාන යටතේ අන්තර්ග්‍රහණය වන නිලධාරීන්ටද ඉහත අනුව උසස්වීම් ලැබීමට හිමිකම් ඇත.

08. කරුණාකර මෙහි සඳහන් කරුණු අදාල නිලධාරීන්ට දැනගැනීමට සළස්වන්න.

ඩී.දිසානායක
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය

ආදර්ශ අයදුම්පත්‍රය

2009.09.24 දිනැති අංක 1620/22 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථාවේ 10 ඡේදයේ අන්තර්කාලීන විධිවිධාන අනුව පුස්තකාලයාධිපති සේවයේ

**II/I/විශේෂ පන්තියට උසස් කිරීමේ අයදුම්පත්‍රය**

01. සේවා ස්ථානය

i අමාත්‍යාංශය :- ..........................................................................................

ii දෙපාර්තමේන්තුව :- ..........................................................................................

iii උප. කාර්යාලය :- ..........................................................................................

02. පත්වීම් ලිපියේ දක්වෙන පරිදි නිලධාරියාගේ/ නිලධාරිණියගේ නම :- .............
........................................................................................... මයා/මිය/මෙනවිය

03. නම වෙනස් කර ඇත්නම් සංශෝධිත නම :- ......................................................
...........................................................................................................

04. උපන් දිනය :- ................................

2010.05.31 දිනට වයස :- අවු ........ මාස ......... දින ..........

05. ස්ථිර පෞද්ගලික ලිපිනය :- .......................................................................
...........................................................................................................

06. පුස්තකාලයාධිපති තනතුරට මුලින් පත්වූ දිනය :- ...........................................

07. i පත්වීම් ලිපියේ අංකය :- .......................................

ii පත්වීම් දිනය :- .......................................

08. ඔබ සේවයේ ස්ථිර කර තිබේද? :- ඔව්/නැත

09. දැනට සිටින ශ්‍රේණිය :- III/ II/ I/අධි

i III ශ්‍රේණියට පත්වූ දිනය සහ එදිනට සේවා කාලය :- ..............................

ii II ශ්‍රේණියට පත්වූ දිනය සහ එදිනට සේවා කාලය :- ..............................

iii I ශ්‍රේණියට පත්වූ දිනය සහ එදිනට සේවා කාලය :- ..............................

iv අධි ශ්‍රේණියට පත්වූ දිනය සහ එදිනට සේවා කාලය :- ..............................

10. අධ්‍යාපන සුදුසුකම් :-

i ..........................................................................................................
...........................................................................................................
...........................................................................................................

ii ..................................................................................................................................
..................................................................................................................................
..................................................................................................................................

iii ..................................................................................................................................
..................................................................................................................................
..................................................................................................................................

iv ..................................................................................................................................
..................................................................................................................................
..................................................................................................................................

v ..................................................................................................................................
..................................................................................................................................
..................................................................................................................................

11. 1997.08.01 දින සිට ක්‍රියාත්මක වූ සේවා ව්‍යවස්ථාව යටතේ ඔබ ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයට අන්තර්ග්‍රහණය වී සිටියේද?

ඔව්/නැත

(i) අන්තර්ග්‍රහණය වී සිටියේනම් අන්තර්ග්‍රහණ ලිපියේ අංකය සහ දිනය :-
සීඑල්එස්/........./...........(ජී)/V දිනය :- ...........................................

(ii) අන්තර්ග්‍රහණය වී නොසිටියේනම් ඔබ 2009.09.02 දින සිට ක්‍රියාත්මක නව පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථාවේ 9:2:2 අනුව අන්තර්ග්‍රහණය වීමට මනාපය ප්‍රකාශ කර අන්තර්ග්‍රහණය වී ඇතිද ?

ඔව් / නැත

12. උසස් කිරීම සඳහා ඉල්ලනු ලබන පන්තිය :-

II පන්තිය / I පන්තිය / විශේෂ පන්තිය

(අදාල නොවන පන්ති කපා දමන්න)

13. උසස් කිරීම සඳහා ඉල්ලනු ලබන පන්තියට අදාලව 2009.09.02 දින සිට ක්‍රියාත්මක සේවා ව්‍යවස්ථාවේ 10:2:2 , 10:3:2 සහ 10:4 ඡේදවලට අනුව සපුරා ඇති සුදුසුකම් :-

i ..................................................................................................................................
..................................................................................................................................
..................................................................................................................................

ii ..................................................................................................................................
..................................................................................................................................
..................................................................................................................................

iii ...............................................................................................................

...............................................................................................................

...............................................................................................................

iv ...............................................................................................................

...............................................................................................................

...............................................................................................................

v ...............................................................................................................

...............................................................................................................

...............................................................................................................

(සහතතික ඡායා පිටපත් අමුණන්න)

14. පුස්තකාලයාධිපති සේවයේ වර්තමාන පන්තියට අදාල කාර්යක්මතා කඩඉම් විභාගය සමත්විද? ඔව් / නැත

(සමත් කිරීමේ ලිපියේ සහතික පිටපත් අමුණන්න)

15. ...............................................................................................................
අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/කාර්යාලයේ පුස්තකාලයාධිපති ......................
(ශ්‍රේණිය) වශයෙන් සේවය කරන .................................................................
.............................................................................. (සම්පූර්ණ නම) වන මා විසින් ඉහතින් සඳහන් කර ඇති සියළුම තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් 2009.09.24 දිනැති අංක 1620/22 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථාවේ 10:2:2 / 10:3:2 / 10:4 වගන්ති (අදාල නොවන වගන්ති කපා දමන්න) ප්‍රකාරව II පන්තියට/I පන්තියට/විශේෂ පන්තියට (අදාල නොවන පන්ති කපා දමන්න) උසස්වීමට සුදුසුකම් ලබන බවත් ප්‍රකාශ කරමි.

දිනය :- .........................

.......................................
නිලධාරියාගේ අත්සන

<u>දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය</u>

...................................................................................................... අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/කාර්යාලයේ .................. ශ්‍රේණියේ පුස්තකාලයාධිපති තනතුරක් දරන ...................................................................................................... මයා/මිය/මෙනවිය II/I/විශේෂ පන්තියට උසස්වීම සඳහා ඉදිරිපත් කර ඇති අයදුම්පත්‍රයේ 1 සිට 14 දක්වා වූ තොරතුරු ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බව සහතික කරමි. මෙම නිලධාරියා/නිලධාරිණිය සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කරමි.

I. සේවා කාලය තුළ ලබාගෙන ඇති අඩවැටුප්/වැටුප් රහිත නිවාඩු විස්තර :-

....................................................................................................................

....................................................................................................................

II. උසස්වීම ඉල්ලනු ලබන දිනට නිලධාරියාගේ/නිලධාරිණිය ගේ ඒකාබද්ධ පුස්තකාලයාධිපතිවරයෙක් වශයෙන් සේවය කළ සම්පූර්ණ සේවා කාලය :-

....................................................................................................................

III. ................ පන්තියට උසස් කරන ලෙස ඉල්ලනු ලබන දිනට III/II/I පන්තියේ සේවය කර ඇති සේවා කාලය :-

....................................................................................................................

IV. උසස් කිරීමට පූර්වාසන්න වසර 05ක සේවා කාලය තුළ සියළුම වැටුප් වර්ධක උපයාගෙන සතුටුදායක සක්‍රීය සේවා කාලයක් තිබේද යන වග :-

....................................................................................................................

V. නිලධාරියාට/නිලධාරිණියට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගෙන තිබේද?
(තිබේ නම් විස්තර සඳහන් කරන්න)

....................................................................................................................

....................................................................................................................

VI. අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ නිර්දේශය :-
................................ දින සිට මෙම නිලධාරියා/නිලධාරිණිය II/I/විශේෂ පන්තියට උසස් කිරීම නිර්දේශ කරමි. / නොකරමි.

දිනය :- ........................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන :- ........................
නම :- ....................................................................
තනතුර :- ................................................................
නිල මුද්‍රාව

<u>අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය</u>

දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඉහතින් සඳහන් කර ඇති නිර්දේශය මවිසින්ද නිර්දේශ කරමි.

දිනය :- ........................

අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන :- ..................................
නිල මුද්‍රාව

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 19/2009

මගේ අංකය :- සීඑල්එස්/ව්‍යා.සං./

අමා.මණ්.සං./V

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු

අමාත්‍යාංශය

නිදහස් චතුරශ්‍රය,

කොළඹ 07.

2009.12.08

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

දිස්ත්‍රික් ලේකම්වරු,

ප්‍රාදේශීය ලේකම්වරු,

## ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථා සංග්‍රහය ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1997.11.19 දිනැතිව අංක 1002/13 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1997.08.01 දින සිට ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථා සංග්‍රහය වෙනුවට ආදේශ කරනු ලැබූ 2009.09.24 දිනැතිව අංක 1620/22 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නව ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථා සංග්‍රහය 2009.09.02 දින සිට ක්‍රියාත්මක වේ.

02. ව්‍යවස්ථාවේ 9.2 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අන්තර්ග්‍රහණය;

i. 1997.08.01 දිනට පෙර පළාත් රාජ්‍ය සේවය හෝ රාජ්‍ය සේවයේ පුස්තකාලයාධිපති තනතුරක සේවයට බැඳුන, 1997.08.01 දින සිට ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථාව යටතට අන්තර්ග්‍රහණයවී සිටි සහ 1997.08.01 දින සිට මෙම නව ව්‍යවස්ථාව බලාත්මක වන දින අතර කාලය තුළ සේවයේ යෙදී සිටි පුස්තකාලයාධිපතිවරුන් මෙම නව ව්‍යවස්ථාව යටතේ පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

ii. නව ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට III ශ්‍රේණියේ සේවයේ නියුතු නිලධාරීන් III පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

iii. නව ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට II ශ්‍රේණියේ සේවයේ නියුතු නිලධාරීන් II පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

iv. නව ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට I ශ්‍රේණියේ සේවයේ නියුතු නිලධාරීන් I පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

v. නව ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට අධි ශ්‍රේණියේ සේවයේ නියුතු නිලධාරීන් විශේෂ පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

03. ව්‍යවස්ථාවේ 9.2.2 උප වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සේවයට අන්තර්ග්‍රහණය වී නොමැති නිලධාරීන් නව ව්‍යවස්ථාව යටතට අන්තර්ග්‍රහණය කිරීම;

i. 1997.08.01 දිනට පෙර රාජ්‍ය සේවයේ පුස්තකාලයාධිපති තනතුරක සේවයට බැඳී සිටි එහෙත් 1997.08.01 දින සිට බලාත්මක වූ ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථාවට අන්තර්ග්‍රහණයට නොසිටි නමුත් මෙම නව ව්‍යවස්ථාව යටතට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කරන නිලධාරීන්, 1997.08.01 දිනැති අංක 1,002/13 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථාවේ අංක 03 ඡේදය යටතේ අන්තර්ග්‍රහණය වීමට නියමිත ශ්‍රේණියට අන්තර්ග්‍රහණයව සිටියා සේ සලකා එම ශ්‍රේණිය පදනම් කරගෙන ඉහත 9.2.1 විධිවිධාන අනුව අන්තර්ග්‍රහණය කරනු ලැබේ. එම නිලධාරීන්ට නව ව්‍යවස්ථාවේ අංක 10 ඡේදය අනුව උසස්වීම් ලැබීමට හිමිකම් ඇත.

ii. 1997.08.01 දිනට පසු රජයේ පුස්තකාලයාධිපති තනතුරක සේවයට බැඳුනු සහ 1997.08.01 දිනට බලාත්මක වූ ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථාව මගින් පාලනය නොවුණු එහෙත් මෙම නව ව්‍යවස්ථාව යටතට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කරන නිලධාරීන් නව ව්‍යවස්ථාවේ III පන්තියට අදාල සුදුසුකම් සපුරා ඇත්නම් එම පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. එසේම එකී නිලධාරීන්ට මෙම ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව උසස්වීම් ලබා ගැනීමට හිමිකම් ඇත. මෙම නිලධාරීන් සඳහා අන්තර්කාලීන විධිවිධාන අදාල නොවේ.

04. අන්තර්කාලීන විධිවිධාන සහ උසස්වීම්

i. 1997.08.01 දිනට බලාත්මක වන පරිදි ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථාව යටතට අන්තර්ග්‍රහණය වූ නිලධාරීන් සහ ඉහත 3 i යටතට ගැනෙන නිලධාරීන් සඳහා පමණක් අන්තර්කාලීන විධිවිධාන අදාල වේ.

ii. මෙම නව ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දින සිට නොවසරක් ඉක්මගිය වහාම නව ව්‍යවස්ථාවේ 06 ඡේදය යටතේ සඳහන් උසස්වීම් ක්‍රම පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වනු ඇත.

iii. අන්තර්කාලය තුළ II, I හා විශේෂ පන්තියට උසස් කිරීම නව ව්‍යවස්ථාවේ 10 වගන්තියේ සඳහන් විධිවිධානයන්ට අනුව සිදු කරනු ලැබේ.

05. නව ව්‍යවස්ථාවේ 9:2:2 අනුව ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථාව අන්තර්ග්‍රහණයට නොසිටියාවූද මෙම නව ව්‍යවස්ථාව යටතට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කරන නිලධාරීන් මේ සමග ඇති මනාප ප්‍රකාශ පත්‍රය සම්පූර්ණකර තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2010.01.15 දිනට පෙර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත එවීමට කටයුතු කළ යුතුය.

06. කරුණාකර, මෙම චක්‍රලේඛයේ අඩංගු කරුණු අදාල නිලධාරීන්ට දැනගැනීමට සලස්වන්න.

ඩී. දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය

පිටපත් :- ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**2009.09.24 දිනැතිව අංක 1620/22 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථා සංග්‍රහ යටතට අන්තර්ග්‍රහණය වීමේ මනාප ප්‍රකාශ පත්‍රය**

01. සේවා ස්ථානය

i අමාත්‍යාංශය :- ......................................................................................

ii දෙපාර්තමේන්තුව :- ......................................................................................

iii උප කාර්යාලය :- ......................................................................................

02. පත්වීම් ලිපියේ දක්වෙන පරිදි නිලධාරියාගේ/ නිලධාරිණියගේ නම :- ....................
.............................................................................................................. මයා/මිය/මෙනවිය

03. නම වෙනස් කර ඇත්නම් සංශෝධිත නම :- .....................................................................
..............................................................................................................................

04. උපන් දිනය :- ...............................

2010.01.15 දිනට වයස :- අවු ........ මාස ......... දින .........

05. ස්ථිර පෞද්ගලික ලිපිනය :- .................................................................................
..............................................................................................................................

06. පුස්තකාලයාධිපති තනතුරට මුලින් පත්වූ දිනය :- ..................................................

07. i පත්වීම් ලිපියේ අංකය :- ......................................

ii පත්වීම් දිනය :- .....................................

08. ඔබ සේවයේ ස්ථිර කර තිබේද? :- ඔව්/නැත

09. දැනට සිටින ශ්‍රේණිය :- III/ II/ I/අධි

i III ශ්‍රේණියට පත්වූ දිනය :- ...........................................

ii II ශ්‍රේණියට පත්වූ දිනය :- ...........................................

iii I ශ්‍රේණියට පත්වූ දිනය :- ...........................................

iv අධි ශ්‍රේණියට පත්වූ දිනය :- ...........................................

10. අධ්‍යාපන සුදුසුකම් :-

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

11. නව ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථාවේ 9:2:2 අනුව ඔබ මෙයට පෙර ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථාව යටතට අන්තර්ග්‍රහණය වී සිටියේද?

ඔව්/නැත

අන්තර්ග්‍රහණය වී සිටියේනම් අන්තර්ග්‍රහණ ලිපියේ අංකය :-

සීඑල්එස්/........./..........(ජී)/V

12. ........................................................................................................ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/කාර්යාලයේ පුස්තකාලයාධිපති ............... (ශ්‍රේණිය) වශයෙන් සේවය කරන ........................................................................ (සම්පූර්ණ නම) වන මම 2009.09.24 දිනැති අංක 1620/22 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ නව ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථා සංග්‍රහය යටතට 2009.09.02 දින සිට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කරමි.

මෙම මනාපය කිසිදු ආකාරයකින් නැවත වෙනස් කිරීමට නොහැකි බව තේරුම් ගනිමි.

දිනය :- ...............................

නිලධාරියාගේ අත්සන :- .............................

නම :- .......................................................

අමාත්‍යාංශ ලේකම්ගේ/ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :-

........................................................................................................ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/කාර්යාලයේ පුස්තකාලයාධිපති .................. (ශ්‍රේණිය) වශයෙන් සේවය කරන ........................................................................................................... මයා/මිය/මෙනවිය විසින් ඉහත සඳහන් ප්‍රකාශය .................................. දින

.............................................................................. හිදී මා ඉදිරිපිටදී අත්සන් කළ බව සහතික කරමි. අයදුම්පතෙහි නිලධාරියා/නිලධාරිණිය සඳහන් කර ඇති තොරතුරු ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදිය.

මෙම නිලධාරියා නව ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථා සංග්‍රහය යටතට අන්තර්ග්‍රහණය වීමට මනාපය ප්‍රකාශ කර ඇති නිසා මේ සමග පහත සඳහන් ලිපිලේඛන මේ සමග එවමි.

i. උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක්
ii. පත්වීම් ලිපියේ සහතික කළ පිටපතක්
iii. සේවය ස්ථිර කිරීමේ ලිපියේ සහතික කළ පිටපතක්
iv. උසස්වීම් ලිපිවල සහතික කළ පිටපත්
v. අධ්‍යාපන සහතිකවල සහතික කළ පිටපත්

දිනය :- ..............................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන :- ..................

නම :- ..................................................................

තනතුර :- ............................................................

නිල මුද්‍රාව

සටහන :- ඉහත 11 වගන්තිය අනුව නිලධාරියා/නිලධාරිණය ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයට අන්තර්ග්‍රහණය වී ඇත්නම් ඉහත ලිපි ලේඛන එවීම අවශ්‍ය නොවන බව සලකන්න.